# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/38 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාත් සභාව

### මහනුවර මහා නගර සභාවේ විනෝද බදු පැනවීම

(267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මහනුවර මහා නගර සභාවේ 2018.12.20 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 8 (25) යටතේ තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව ඉහත කී විනෝද බදු ආඥාපනතේ දෙවන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළ කරනු ලැබේ.

මෛත්‍රී ගුණරත්න,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

### යෝජනාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ අංක (2) 1 වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු අය කිරීම සඳහා සෑම මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, තුරඟ හෝ සංගීත සංදර්ශනයක්, ප්‍රදර්ශන ක්‍රීඩා තරගයක්, සැණකෙළියක් හෝ වෙනත් විනෝද සංදර්ශනයක් ප්‍රසංගයක් සඳහා සඳහා සහ මුදල් අය කරනු ලබන සෑම කටයුත්තක් සඳහාම ඇතුළත්වීමේ ප්‍රවේශපත්වල මුහුණත වටිනාකමෙන් 25%ක විනෝද බද්දක් ද සිනමාහල්වල පවත්වන සියලුම චිත්‍රපටි සංදර්ශන වෙනුවෙන් පමණක් ඇතුළත්වීමේ ප්‍රවේශ පත්වල මුහුණත වටිනාකමෙන් 7.5%ක විනෝද බද්දක් පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

08 - 797

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - PG 4608 - 17 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.